කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective

Established 1984

# පාලර්මේන්තු මන්ත්‍රී තිස්සකුට්ටිආරච්චි පාලර්මේන්තුවේ කල ස්ත්‍රී ද්‍රෝහී ප්‍රකාශ හා සදාචාර විරෝධී හැසිරීම පිළිබඳ ප්‍රකාශය

*කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය*
*2021 නොවැම්බර් 25*

නොවැම්බර් 20 වැනිදා අයවැය විවාදයේදී පාලර්මේන්තු මන්ත්‍රී ජනක තිස්සකුට්ටිආරච්චි, මන්ත්‍රිනී රෝහිණී කුමාරි විජේරත්නට එරෙහිව ස්ත්‍රී ද්‍රෝහී ප්‍රකාශයක් කළේය. ඇයගේ ප්‍රකාශය කැත විහිළුවක් ලෙස පෙනෙන පරිදි අයවැයට විරුද්ධව ඇය කල ඉතා වලංගු ප්‍රකාශය ඔහු සමච්චලයට ලක් කළේය. අමාත්‍යවරයාගේ කතාව කෙතරම් පිළිකුල් සහගත වූවා ද, ඔහුට ප්‍රීති ඝෝෂා කිරීමත්, ඔහුගේ ද්වේෂ සහගත කතාව දිගටම කරගෙන යාමට ඔහුට හැකි වන පරිදි ඔහුගේ කාලය දීසර් කිරීමත් එම කතාව තරම්ම ලැජ්ජා සහගතය.

දේශපාලන වේදිකාවේ සහ පාලර්මේන්තු වාද විවාද වලදී කැපී පෙනීම සඳහා මෙවැනි වෛරී ප්‍රකාශ සාමාන්‍යකරණය කිරීමෙන් පෙන්නුම් කරන්නේ දේශපාලන පරමාදශර් වල බංකොලොත්භාවය පමණක් නොව ස්ත්‍රීන් සංලක්ෂිත වන ආකාරය සහ පුරුෂාධිපත්‍ය සන්දහර්ය තුළ හා දේශපාලන සංස්කෘතිය තුළ ස්ත්‍රිය තබා ඇති ආකාරයයි. පාලර්මේන්තුව වගේම රටත් දේශපාලනයේ කාන්තා නියෝජනයෙන් 25%ක්වත් ලබා ගැනීමට තවමත් අරගල කරන රටක, මෙම හැසිරීම දැනටමත් දේශපාලනයේ යෙදී සිටින කාන්තාවන් අධෛර්යමත් කරනවා පමණක් නොව, නිවෙස්වලදී, පොදු ප්‍රවාහනයේදී හෝ පාසල් තුළ පවා කාන්තාවන්ට එරෙහි හිංසනයට ඉඩ සලසා දීම කණගාටුවට කරුණකි.

අපි තරයේ ඉල්ලා සිටින්නේ පාලර්මේන්තු මන්ත්‍රී තිස්සකුට්ටිආරච්චි මහතා රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීවරියගෙන් වහා සමාව ගන්නා ලෙසත්, මෙවැනි ද්වේෂ සහගත ප්‍රකාශ වැළැක්වීමට යාන්ත්‍රණයක් පාලර්මේන්තුව ක්‍රියාත්මක කරන ලෙසත්ය. පාලර්මේන්තුව තුළත් රට තුළත් සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියක් ඇති වන අයුරින් කටයුතු කරන ලෙස ජනතාව නියෝජනය කරන පාලර්මේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිමු.


56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

Telephone: +94-11-2690192, 5632045, 5635900, 5635800, 2690201, Fax: +94-11-2690192, 2690201, Email: wmcsrilanka@gmail.com
www.womenandmedia.org facebook.com/womenandmediacollective twitter.com/womenandmedia

Registration No. GA 2476